# නිවේදනය යි!

1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ නම් කරන ලද සියළුම බලයලත් නිලධාරිවරුන් (Authorized Officers) සහ සියළුම නඩු පැවරීමේ හා නඩු කටයුතු මෙහෙයවීමේ බලයලත් නිලධාරිවරුන් (Officers Authorized to Institute & Conduct Prosecutions) වෙත:

1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත උල්ලංඝනය කරමින් ඇසිටැමිප්‍රිඩ් 20% එස්.පී. (Acetamiprid 20% SP) පළිබෝධනාශක බෙදා හැරීම හා අලෙවි කිරීම.

වර්ෂ 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 14 වන වගන්තියට අනුව රට තුළ භාවිතා වන සියළුම පළිබෝධනාශක නිෂ්පාදන අනුමත කර අනිවාර්යයෙන් ලියාපදිංචි වී තිබිය යුතුය. එහෙත්, විවිධ අවස්ථා ගණනාවක දී අනවසර ලෙස නීති විරෝධී මාර්ගවලින් යම් යම් පළිබෝධනාශක රට තුළට ගෙන්වා වෙළෙඳපොලේ අලෙවි කිරීමට තබා තිබිය දී හමු වූ අවස්ථා ද ඇත. මෑතකාලීන අත්දැකීම් අනුව මෙසේ වංචනිකව බෙදාහරින නිෂ්පාදන අතර ඇසිටැමිප්‍රිඩ් 20% එස්.පී. (Acetamiprid 20% SP) අඩංගු පළිබෝධනාශක ද පවතින බව හඳුනාගෙන ඇත. මුහුදු මාර්ග ඔස්සේ නීති විරෝධී ලෙස පළිබෝධනාශක ඉන්දියාවෙන් මෙ රටට රැගෙනවුත් කූඨ ජාවාරම්වල යෙදී සිටින පුද්ගල කණ්ඩායම් විසින් මෙම නීති විරෝධී කටයුතු සිදුකරන බව මූලික පරීක්ෂණවල දී අනාවරණය කර ගෙන ඇත. මෙවැනි නිෂ්පාදන වෙළෙඳපොලේ පැවතීම පළිබෝධනාශක නියාමන කාර්යය අභියෝගාත්මක සහ සමාජ විවේචනයට ලක්වීමට හේතුවේ.

වර්ෂ 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ ලියාපදිංචි ඇසිටැමිප්‍රිඩ් 20% එස්.පී. (Acetamiprid 20% SP) අඩංගු නීත්‍යාණුකූල නිෂ්පාදන පහත සඳහන් වේ.

1. ඇසිටා ඇසිටැමිප්‍රිඩ් 20% එස්.පී. (ලි.ප.අංකය K680000)
2. හොලියෙස්ටර් ඇසිටැමිප්‍රිඩ් 20% එස්.පී. (ලි.ප.අංකය K680100)
3. මොස්පිලාන් ඇසිටැමිප්‍රිඩ් 20% එස්.පී. (ලි.ප.අංකය N020000)
4. බවර්ස් ඇසිටැමිප්‍රිඩ් 20% එස්.පී. (ලි.ප.අංකය N340000)

අනුමත කරන ලද පළිබෝධනාශක සංයෝජන පිලිබඳ තොරතුරු අඩංගු ලැයිස්තුව www.doa.gov.lk දරන වෙබ් අඩවියට ප්‍රවේශවීමෙන් හෝ 2016.11.24 දින අංක 1994/71 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් නිවේදනය, www.documents.gov.lk මඟින් හෝ පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කර ඇති වලංගු බලපත්‍ර පරීක්ෂා කිරීම මඟින් හෝ දැනගත හැකි ය.

හිල්ප්‍රිඩ් (HILPRID) සහ මැජික් (MAGIC) යන නම්වලින් සඳහන් ඇසිටැමිප්‍රිඩ් 20% එස්.පී. (Acetamiprid 20% SP) අඩංගු නිෂ්පාදන සම්බන්ධයෙන් කිසිදු නීත්‍යාණුකූල වලංගු භාවයක් නොමැති බව මෙයින් අවධාරණය කරමි.

දිවයිනේ සමහර පළිබෝධනාශක අලෙවිසැල් සම්බන්ධ කර ගනිමින් සිදු කරන මෙම නීති විරෝධී අලෙවි ක්‍රියාකාරකම් පිළිබඳව සියළුම පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ නම් කරන ලද සියළුම බලයලත් නිලධාරිවරුන් හා සියළුම නඩු පැවරීමේ හා නඩු කටයුතු මෙහෙයවීමේ බලයලත් නිලධාරිවරුන් අවධානයෙන් සිටින ලෙස මෙයින් නිවේදනය කරනු ලැබේ. සියළුම නීති විරෝධී ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වර්ෂ 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ පැවරී ඇති විධි විධාන පරිදි විධිමත් විමර්ශන පවත්වා නීත්‍යාණුකූල පියවර ගන්නා මෙන් මෙයින් දැනුම් දෙමි.


ආචාර්ය ජේ.ඒ. සුමිත්,
පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්.

2020 පෙබරවාරි මස 10 වන දින,
පේරාදෙණිය.

Tel./Fax.) 081 2388135 or (Tel.) 081 2388076





- හිල්ප්‍රිඩ් (HILPRID) නමින් සඳහන් ඇසිටැමිප්‍රිඩ් 20% එස් .පී.(Acetamiprid 20% SP)




- මැජික් (MAGIC) යන නමින් සඳහන් ඇසිටැමිප්‍රිඩ් 20% එස් .පී.(Acetamiprid 20% SP)